සිංහල පරිවර්තනය

උතුරු පළාත් ප.රා.සේ.කො.සභා චක්‍රලේඛ අංක: **11/2022**

මගේ අංකය: **NP/07/10/04/68**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
13.05.2022

අමාත්‍යාංශ ලේකම්වරුන්, උතුරු පළාත.
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, උතුරු පළාත.
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**උතුරු පළාත් තාක්ෂණ සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය– 2020(2022)**

12.01.2016 වැනි දින ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලදුව 01.06.2013 වැනි දින සිට ක්‍රියාත්මක වන උතුරු පළාත් තාක්ෂණ සේවයේ අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවට අනුකූලව උතුරු පළාත් තාක්ෂණ සේවයේ 1 වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් **2022 අගෝස්තු** මාසය වන විට කොළඹ දී පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිමි.

2. 2020.12.31 වැනි දිනට –

(i) උතුරු පළාත් තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් **වසර පහක (5) ක** සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කර නියමිත වැටුප් වර්ධක **පහ (5)** ම උපයා ගෙන ඇති,

(ii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක (5) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති,

(iii) 3වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී ඇති නිලධරයන් මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

**3. විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පහත සඳහන් වැටුප් ක්‍රමය බලපැවැත්වේ:**

(MN-7-2006 4 වන පියවර) **රුපියල් 43,845 8 x 755 - 18 x 1,030 - රුපියල් 68,425**

**4. උතුරු පළාත් තාක්ෂණ සේවය I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ පටිපාටිය පහත සඳහන් පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ:**

(i) විභාග ප්‍රතිඵල මත උතුරු පළාත් තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට 2020.01.01 දින සිට 2020.12.31 වැනි දින දක්වා දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල එම තනතුරුට දක්නට ලැබෙන පුරප්පාඩු සම්පූර්ණ කරන ලැබේ.

(ii) විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල අදාළ කර ගත යුත්තේ 2020.01.01 වැනි දින සිට 2020.12.31 වැනි දින දක්වා පවතින විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා පමණයි.

(iii) **බඳවා ගනු ලබන ප්‍රතිශතයන් :**
**සීමිත පදනම මත 40%**
**ජ්‍යෝෂ්ඨතාවය හා කුසලතා පදනම මත 60%**

(iv) අනුමත තනතුරු සංඛ්‍යාව 04 ක් වන විට සීමිත තරග විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 25% ක් වන අතර(ප්‍රතිශතය) ජ්‍යෝෂ්ඨතාවය හා කුසලතාවය යටතේ බඳවා

ගනු ලබන ප්‍රතිශතය 75%ක් විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව **03 ක්** වන විට ඉහත සීමිත තරඟ විභාගයෙන් බඳවා ගනු ලබන ප්‍රතිශතය 33.33% ක් හා ජ්‍යෝෂ්ඨතාවය හා කුසලතාවය මත බඳවා ගන්නා ප්‍රතිශතය 66.66% විය යුතුයි;

(v) උතුරු පළාත් තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට පුරප්පාඩු සංඛ්‍යාව 4 ට වඩා වැඩි නම් ඉහත **4.(iii)** ඡේදයේ සඳහන් ප්‍රතිශතයන්ට යටත්ව සීමිත තරඟ විභාගයේ විභාග ප්‍රතිඵල මත පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුයි ;

(vi) **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්** වෙනුවට විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත එයින් සමත්වන්නන් සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** විසින් පත්කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මඟින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේදී දැක්වූ කුසලතා අනුපිළිවෙළ මත හා සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාවට අනුකූලව විභාගය පැවැත්වූ දින සිට ක්‍රියාත්මකවන පරිදි විශේෂ ශ්‍රේණියට තනතුරු උසස් කිරීම **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** විසින් සිදු කරනු ලැබේ ;

(vii) පුරප්පාඩු සම්පූර්ණ කරන අවස්තාවේදී අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු ඇතිවූ දිනට ප්‍රථම මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගේ කුසලතා අනුපිළිවෙළ අනුව නියමිත තනතුරු උසස් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

5. මෙම විභාගයට අයදුම් කිරීම සඳහා ආදර්ශ අයදුම්පත්‍රය දැන්වීම අවසානයේ පළ කර ඇති අතර එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව අයදුම්කරුවන් විසින් තම අයදුම්පත්‍රය සකස් කර ගත යුතුයි. පසුව එම නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, 393/48 කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට 2022.06.03 වැනි දිනට ප්‍රථම,තම අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**6. අයදුම්කරුගේ අනන්‍යතාවය සනාථ කිරීම :**

(i) විභාග ශාලාවේදී තමන් පෙනී සිටින එක් එක් විෂයය සඳහා විභාග අධීක්ෂණ නිලධාරියා තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාව අයදුම්කරුවන් විසින් සනාථ කළ යුතුයි. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් කුමක් හෝ එක් ලේඛනයක් විභාග අධීක්ෂණ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි:-

(අ) ජාතිකා හැඳුනුම්පත;
(ආ) වලංගු විදේශ බලපත්‍රය;
(ඉ) වලංගු රියදුරු බලපත්‍රය.

(ii) එපරිදි විභාග අපෙක්ෂකයන් තම අනන්‍යතාවය සනාථ කරගැනීමට තම මුහුණ හා කන් ආවරණය නොවන පරදි විභාග ශාලාව වෙත පිවිසිය යුතුයි. මේ අනුව තම අනන්‍යතාවය සනාථ කිරීමට ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන්ට විභාග ශාලාව තුළට පිවිසීමේ අවසරය අහෝසි කරනු ලැබේ. එමෙන්ම විභාග ශාලාවට ඇතුල් වූ පසු විභාගය අවසන්වී පිටත් වන තුරු විභාග බලධාරීන්ට අයදුම්කරුවන් හඳුනා ගැනීමට පහසු වන පරිදි මුහුණ හා කන් ආවරණය නොකළ යුතුයි.

**7. අයදුම්පත සකස් කිරීම :**

(i) "A4" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් අයදුම්පත සකස් කර ගත යුතුයි. අංක 1 සිට 5 දක්වා පළමු පිටුවට ඇතුළත් විය යුතුයි. අයදුම්පත පරිගණක ගත කර සකස් කර ගත හැකි අතර එය අයදුම්කරුගේ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිරවිය යුතුයි.

(ii) අයදුම්පත සකස් කරන විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල හා දෙමළ අයදුම්පත්වල අදාළ මාධ්‍යයට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුයි. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ තොරතුරු සපයා ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින්,සම්පූර්ණ කරන ලද අයදුම්පත් මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න අයදුම්කරු විසින් සහතික කරගත යුතුයි. එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වඩාත් ප්‍රයෝජන වේ.

(iii) අයදුම්කරුවන් තම අයදුම්පතේ සඳහන් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට **අනුමැතිය නොලැබේ**. මෙම විභාගය සඳහා අයදුම්කරුවන් ගෙන් සිංහල දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන් වලින් අයදුම්පත් ඉදිරිපත් වන විට එම භාෂා මාධ්‍යයන් වලින් විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. අයදුම්කරුවන් තමන් පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුයි.

(iv) පළමු වරට මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවලදී විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් රුපියල් 600.00 ක් විභාග ගාස්තු වශයෙන් උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ** අංක 3401 දරණ තැන්පත් ගිණුමට බැර කර ලබාගත් කුවිතාන්සියේ මුල්පිටපත අයදුම්පතේ නියමිත කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුයි. **විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ**. විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා. ලද ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තු නැවත ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම සිදු කරනු නොලැබේ.

**සටහන :-**

කොවිඩ 19 වසංගතය හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබාදී ඇති මගපෙන්වීම් හා උපදෙස් අයදුම්කරුවන් පිළිපැදිය යුතුයි.

8. (i) මෙම චක්‍රලේඛ දැන්වීමේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇති බව පූර්ව නිගමනයක් මත දැන්වීමේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම නිර්දේශ කර ඇත්නම් අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින මාධ්‍යය, අයත් වන රාජ්‍ය සේවය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය හා සහතිකය නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇත්නම් එම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින නිලධාරීන් තම අත්සන සහතික කළ විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි. එවැනි ප්‍රවේශ පත්‍රයක් නැති අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. එසේම අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම විභාග සඳහා සියලුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුයි.

(ii) අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පුවත්පත් නිවේදනයක් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. එම නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත පසුවත් විභාග ප්‍රවේශපත්‍රය ලැබුණේ නැත්නම් දැන්වීමේ සඳහන් ප්‍රකාර **"විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව"**වෙත දැන්විය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා විසින් අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුයි. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් ඉහත සඳහන් තොරතුරු සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගත හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් සඳහන් කරමින් ආවරණ ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකයට යොමු කර ඒ පිළිබඳ විමසා බැලීම වඩාත් ඵලදායීවනු ඇත. එසේ විමසීමේදී විභාග

දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින යම්කිසි තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තිබෙන අයදුම්පතේ ඡායාපිටපත විභාග ශාස්තු ගෙවීම අදාළ නම් ලදුපතේ පිටපත අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

(III) අයදුම්පත්‍රයේ හා, විභාග ප්‍රවේශපත්‍රයේ විභාග අපේක්ෂකයාගේ අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු මඟින් සහතික කරවා ගත යුතුයි. අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තමාට නියම කර ඇති නියමිත අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාගය පැවැත්වෙන දිනයේ දී තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි. ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*9.* ඉහත *(8)* **වැනි ඡේදයේ** සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කරන ලියකියවිල සළකා බලනු නොලැබේ.

*10.* **විභාග ප්‍රතිඵල නිකුත් කිරීම**.- විභාග ප්‍රතිඵල පළාත් රාජ්‍ය සේවා ලේකම් විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

*11.* **විභාග පරිපාටිය**.-

මෙම විභාගය සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන් ගෙන් පැවැත්වීමට නියමිත වන අතර අයදුම් කරන භාෂාව පසුව වෙනස් කළ නොහැකිය.

(i) I ශ්‍රේණියේ සිටින නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විතයි.

*(1)* අභියෝග්‍යතාව. කාලය : පැය *1* යි - ලකුණු *100*

*(2)* කළමනාකරණය. කාලය : පැය *3* යි ලකුණු *100*

සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහාම අවම වශයෙන් ලකුණු *40%* ලබාගත යුතුවේ.

**පළමු ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශය පහත සඳහන් වේ :**

**අභියෝග්‍යතාව** - **විෂය අංක** *(1)*.

තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්යසාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කර තිබේද යන්න හා දැනුම භාවිතයේදී ඉහළ ප්‍රවීනතාවයක් දක්වන්නේ ද යන්නත් මැන බැලීමේ පරීක්ෂණයකි. බහුවරණ හා කෙටි පිළිතුරු සපයන මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුයි.

**දෙවන ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශය පහත සඳහන් වේ:**

**කළමනාකරණය** - **විෂය අංක** *(2)*

(i) කළමනාකරණ මූලධර්මය

(ii) කළමනාකරණ කාර්යයන් :

සැලසුම් කිරීම
තීරණ ගැනීම
තීරණ ගැනීමේ ක්‍රියාවලිය
සංවිධානය
මාණ්ඩලීකරණය
මෙහෙයවීම
අභිප්‍රේරණ ක්‍රියාවලිය
නායකත්වය
පාලනය
පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය

(iii) සහභාගිත්ව කළමනාකරණය
(iv) කළමනාකරණ පරිසරය
(v) සිද්ධි අධ්‍යයනය

මෙය ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

*12.* විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයන් යටත් වන අතර ඉහත සඳහන් නීතිරීතීන් උල්ලංඝනය කළොත්, ඔහු විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන දඬුවමට යටත්වේ. මෙම නිවේදනයේ සඳහන් කොන්දේසීන්ට අනුව කිසියම් විභාග අපේක්ෂකයකු එම විභාගයට පෙනී සිටීමට සුදුසු නැති බව අවධානයට ලක්වූ විට විභාගයට ප්‍රථම හෝ පසුව හෝ ඔහුගේ/ඇයගේ විභාග අපෙක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

*13.* මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් තිබේ නම් ඒ සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ තීරණය අවසන් තීරණය .වේ.

*14.* මෙම චක්‍රලේක දැන්වීමේ සිංහල දෙමළ භාෂා මාධ්‍යයන් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට දෙමළ භාෂා මාධ්‍යයේ නිවේදනය බලපැවැත්වේ.

*15* මෙම චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාල යටතේ සේවයේ නියුතු නිලධාර/නිලධාරිනියන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ එමෙන් මෙම තොරතුරු උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය වන www.np.gov.lk යන ලිපිනය යටතේ Exams & Recruitments ——▶ Advertisement මගින් ලබා ගත හැකිය.

***"රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අංක 2279 දරණ 2022.05.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය ආවරණය කර මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ"***

සි. තිරුවාකරන්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත්.
*13.05.2022*

පිටපත් - *01.* ප්‍රධාන ලේකම්, උතුරු පළාත. - දැ ගැ ස
*02.* ආණ්ඩුකාරවරයාගේ ලේකම්, උතුරු පළාත. - දැ ගැ ස